**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව**
--------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල්රෙගුලාසි 1645(අ) | දෙපාර්තමේන්තුව සතු වාහන 2ක් සඳහා ලොග් පොත් පවත්වා නොතිබුණු අතර වාහන 7ක්සඳහා ලොග් පොත් පවත්වා ගෙන තිබුණද ඒවා යාවත්කාලීන කර නොතිබුණි. | වාහන සඳහා ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගත යුතුවීම. | ඉදිරිපත් කර නොමැති ලොග් පොත් 02 හි වාහන ධාවන තත්ත්වයේ නොමැත. |
| (ආ)2016 දෙසැම්බර් 29 දිනැති හා 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය. | දෙපාර්තමේන්තුව සතු වාහන 9 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතුවීම. | ඉදිරියේදී එම කාර්යය සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ)2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | අධිකරණ අමාත්‍යාංශය ලබා දී තිබූ වාහනයක අයිතිය නිරවුල් කර ගැනීමට 2019 අප්‍රේල් 30 දිනවන විටත් කටයුතු කර නොතිබුණි. | භාවිතා කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය නිරවුල් කරගත යුතු වීම. | අයිතිය පැවරීමේ අයදුම්පත්‍රය ලබා දෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

---

පහත සඳහන් නිරීක්ෂණයන්කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම්වල වටිනාකම බැරකම් ලේඛනයට අනුව රු.644,004 ක් | වර්ෂයට අදාළ සත්‍ය බැරකම් වටිනාකම මූල්‍යප්‍රකාශනවල දැක්විය | ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ ද ඊට අදාල බිල්පත් ගිණුම් පියවීමට පෙර ගිණුම් අංශය වෙත ලැබී |

| | | |
|---|---|---|
| වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.72,319 ක් වූයෙන් රු.571,685 ක වෙනසක් නිරීක්ෂණය විය. | යුතුවීම. | නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට නොහැකි විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94 (I) ප්‍රකාරව, සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා වියදම් හෝ බැදීම් ඇතිකර නොගත යුතු වුවත් ඊට පටහැනිව වැය විෂයයන් 4ක් සඳහා ප්‍රතිපාදන ඉතිරිය වූ රු.169,844 ක මුදල ඉක්මවා රු.575,082 ක බැරකම්වලට එළඹ තිබුණි. | විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා කිසිදු වියදමක් හෝ බැදීමක් ඇති කර නොගත යුතුවීම. | මෙම වියදම්වලට අදාළ බිල්පත් ගිණුම් පියවීමට පෙර ගිණුම් අංශය වෙත ලැබී නොතිබීම නිසා ඒ පිළිබඳව දැනුවත් වීමක් නොවූ බැවින් එම වියදම් නොසලකා අනෙකුත් වියදම් දැරීම මත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමක් සිදු විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 සැලැසුම් කිරීම

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යසාධන වාර්තාව අනුව භාර හා බූදල්වලට අදාළව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරන ලද මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 16.60 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණදමෙම ආදායම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | වර්ෂය තුළ අපේක්ෂිත ආදායම් ක්‍රියාකාරී සැලැස්ම මඟින් හෙළිදරව් කළ යුතුවීම. | මෙම ආදායම් ඇස්තමේන්තුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවීම අඩුපාඩුවක් ලෙස පිළිගන්නා අතර ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**3.2** අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිලාභීන් 267 දෙනෙකු සඳහා රු.මිලියන 8.49ක පුණ්‍යාධාර ගෙවීමට අපේක්ෂා කළ ද ප්‍රතිලාභීන් 55 ක් සඳහා රු.මිලියන 2.78ක් පමණක් ලබා දී තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම නිසි අධ්‍යයනයකින් පසුව කළ යුතුවීම. | මින් ඉදිරියට ගෙවී ගිය වර්ෂ කිහිපයක දත්ත උපයෝගී කර ගනිමින් ඒ අනුව ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ)ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය යටතේ සිද්ධස්ථාන 493 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කළ ද ලබා කරගත් භෞතික ප්‍රගතිය සියයට 57 ක් විය. එහෙත් මූල්‍ය ප්‍රගතිය සියයට 118 ක් වූ බැවින් ඇස්තමේන්තු සකස් කිරීමේ දී නිසි අධ්‍යයනයකින් තොරව සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු සකස් කිරීම නිසි අධ්‍යයනයකින් කළ යුතුවීම. | බලාපොරොත්තු නොවූ පරිදි දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ලේ සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබා දීම, ස්ථාපකවරුන්ගේ හදිසි අවශ්‍යතා මත තීරණ වෙනස් කිරීම, විශේෂ විමර්ශන කටයුතු නිසා තාවකාලිකව ගෙවීම් කටයුතු ප්‍රමාද වීම, ආගමික ආධාර සඳහා නිසි පරිදි ඉල්ලීම් නොමැති වීම වැනි හේතු නිසා භෞතික ප්‍රගතිය අඩු වී මූල්‍ය ප්‍රගතියේ යම් වැඩි වීමක් සිදු වී ඇත. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

------
------
------
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |

| | | |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන වතු 12 කින් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 14.28 ක ලාභයක් ඉපයීමට අපේක්ෂා කළ ද සත්‍ය ලාභය රු.මිලියන 1.59ක් වූයෙන් ලඟා කරගත් ප්‍රගතිය සියයට 11 ක් විය. තවද, 2017 වර්ෂයේ දී මෙම වතුවලින් ඉපයූ රු.මිලියන 11.25ක ලාභයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී සියයට 86 කින් ලාභය අඩු වී තිබුණි. | වතු පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් පවතින ගැටළු සමාලෝචනය කර ආදායම් වර්ධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවීම. | සියළු වතුවලින් රජයේ ගාස්තු ලෙස රු.1,885,746 ක් ගෙවා තිබීම, මුහන්දිරම් ජයවික්‍රම බූදලය සඳහා ආදායම් නොලැබීම, 2018 වර්ෂයේ රබර්වල සාමාන්‍ය මිල මට්ටම අඩු වීම හා කළුතර රිච්මන්ඩ් පාර්ක් වත්තේ නැවත රබර් වගා කිරීම හා මත්තක වත්තේ නැවත තේ වගා කිරීම සඳහා වියදම් දැරීම මේ සඳහා හේතු වී ඇත. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී වතු 5 කින් රු.මිලියන 4.41ක අලාභයක් ලබා තිබුණු අතරවතු පැවරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු කිරීමේ දී එම තත්ත්වය අහිතකර ලෙස බලපා තිබුණි. | වතු පරිපාලන කටයුතු විධිමත් කළ යුතු වීම හා කළමනාකාරීත්වය විසින් වතු අධීක්ෂණය කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව සඳහා පලපුරුදු වතු අධිකාරීවරුන් බඳවා ගැනීමට කටයුතු කල අතර වතු පරිපාලනය විධිමත් කිරීම සඳහා ක්ෂේත්‍රයේ නිපුණතා ඇති උපදේශක මහතකුගේ සේවාව ලබා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව මනා කාර්යක්ෂම කළමනාකරණයක් තුළින් අලාභ ලැබූ වතු ලාභ තත්ත්වයට පත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර ඉදිරියේදී ලාභ වැඩි කරගැනීමට අපේක්ෂිත වේ. |

**3.4** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| <u>**ණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| (අ) 2018 අගෝස්තු 28 දින වතු 01ක බූදලයක් භාරකාර මණ්ඩලය වෙත පවරා තිබුණු අතරඑදින දක්වා වාර්තා කළ ලාභ/අලාභ තත්ත්වය කාර්යසාධන වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති වතු පවරා දෙන තෙක් එහි කාර්ය සාධනය කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු සඳහා 2013 වර්ෂයේ භාර දුන් එන්.ඩී.ජ් සිල්වා විජේසිංහ බූදලයට අයත් වනස්ගල්ල වත්තෙන් දෙපාර්තමේන්තුවට අය විය යුතු මුදල් අය කර ගෙන අදාළ වතු හිමිකරුවන්ට ලබා දීමෙන් එම වත්ත සම්බන්ධව දෙපාර්තමේන්තු කාර්යභාරය අවසන් කර ඇත. එම නිසා 2018 වර්ෂයට එම වත්තේ |

| | | |
|---|---|---|
| | | කාර්ය සාධනය ඇතුළත් නොකෙරුණි. |
| (ආ)දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරනු ලබන භාර/බුදල් අවසන් ගිණුම්, වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ක්‍රියාකාරී සැලසුම්වල දක්වා ඇති වතුවලින් ඉපයූ ලාභ/අලාභ තත්ත්වයන් පිළිබඳ තොරතුරු එකිනෙකට වෙනස් බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන විවිධ ප්‍රකාශන තුළින් නිවැරදි හා විශ්වාසනීය තොරතුරු ඉදිරිපත් කළ යුතුවීම. | වතුවල වාර්ෂික කාර්යසාධන වාර්තාව සඳහා වර්ෂය මුලදී මුදල් පදනම මත හා අවසාන ගිණුම් සඳහා උපචිත සංකල්පය මත ගලපා ගිණුම් පිළියෙල කර ඇත. එම නිසා කාර්යසාධන වාර්තාවේ හා අවසාන ගිණුම්වල ලාභ අලාභ තත්වයන්හි වෙනස්කම් සිදුවී ඇත. |
| (ඇ)වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 9.08 ක පිරිවැයක් සඳහා ප්‍රසම්පාදන කාර්යයන් සැලසුම් කර තිබුණු අතර වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සඳහා රු.මිලියන 8.79ක් වැය කර තිබුණි.එහෙත් ප්‍රසම්පාදන කාර්යසාධනය පිළිබඳ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාවේ හෙළිදරව් කර නොතිබුණි. | කාර්යසාධනය පිළිබඳ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාවේ හෙළිදරව් කිරීමට කටයුතුකළ යුතුවීම. | දෙපාර්තමේන්තුව ඉහළ වටිනාකමින් යුතු ප්‍රසම්පාදන කටයුතු කිසිවක් සිදු නොකරන බැවින් ඒ පිළිබඳ තොරතුරු වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ ඇතුළත් නොකරන ලද අතර ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ තොරතුරු කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ඈ) විදේශ වන්දි ගෙවීම් සහ විහාර වන්දි නිදහස් කිරීම් යටතේ සමාලෝචිත වර්ෂයේ ලද අයදුම්පත් ප්‍රමාණය සහ ලද වන්දි මුදල් වටිනාකම පිළිබඳ තොරතුරු කාර්යසාධන වාර්තාවෙහි ඇතුලත් කර නොතිබුණි.ඒ හේතුවෙන් වාර්තාව පරිශීලනය කරන්නන්හට එම අංශවල කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි හා විශ්වාසනීය තොරතුරු ඉදිරිපත් කළ යුතුවීම. | විදේශ වන්දි ගෙවීම් හා විහාර වන්දි නිදහස් කිරීම් යටතේ අදාළ ගෙවීම් පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් කර ඇති අතර ඒ වෙනුවෙන් ලද අයදුම්පත්‍ර ප්‍රමාණය සහ වන්දි මුදල් වටිනාකම පිළිබඳ තොරතුරු කාර්ය සාධන වාර්තාවට ඇතුළත් නොකිරීම අඩුපාඩුවක් ලෙස පිළිගනිමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාව 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 මැයි 31 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 ඔක්තෝබර් 10 දින විගණනය වෙත ලැබී තිබුණු නමුත් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන වතු 12 ට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම් තහවුරු කළ යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වතු 12 ට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැති බව පිළිගන්නා අතර ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරමි. |

**3.6 පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2007 ජනවාරි 27 දින වාහනයක් අනතුරට පත්වීමෙන් රු.254,038 ක අලාභයක් සිදු වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104 යටතේ කරන ලද පරීක්ෂාවෙන් පසුව අලාභය රියදුරුගෙන් අයකර ගැනීම සඳහා 2007 මැයි 07 දින අත්තනගල්ල දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නඩුව නිෂ්ප්‍රභ වී තිබුණි. | පාඩු හා හානි වගකිව යුතු අයගෙන් අයකර ගැනීම හෝ පොත් වලින් කපා හැරීම සිදු කළ යුතුවීම. | අධිකරණ අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන ඉදිරියේදී පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)විදේශ රැකියාවක නියුක්තව සිටියදී විවිධ හේතූන් නිසා මියයන පුද්ගලයින් වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයහරහා ලැබෙන වන්දි මුදල්, වැටුප් හා වේතන ආදිය ඔවුන්ගේ නීත්‍යානුකූල හිමිකරුවන්ට ගෙවීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. 2017 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.මිලියන 175.29 ක් වූ විදේශ වන්දි 335 ක් ගෙවිය යුතුව පැවති අතර සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 417.86ක් වූ විදේශ වන්දි අයදුම්පත් 170 ක් ලැබී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දී නිදහස්කළ අයදුම්පත් සංඛ්‍යාව 113 ක් පමණක් වූ අතර එහි වටිනාකම රු.මිලියන 275.92ක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත ලැබෙන වන්දි මුදල් අයදුම්පත් නිදහස් කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | වන්දි හිමිකරුවන් පිළිබඳ තොරතුරු, සම්බන්ධිත රාජ්‍ය ආයතන මඟින් සොයා ගැනීමට (විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ග්‍රාම නිළධාරී ආදී) කටයුතු කළ යුතුවීම සහ විදේශ වන්දි නිදහස් කිරීම කාර්යක්ෂම කළ යුතුවීම. | වන්දි මුදල් අයදුම්පත් නිදහස් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයක් නොවන බවත්, හිමිකරුවන් පිළිබඳ තොරතුරු නොමැතිකම, හිමිකරුවන් දැනුවත් කලද වන්දි ලබා ගැනීමට නොපැමිණීම, විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් තොරතුරු නොලැබීම, හිමිකරුවන් සොයා ගැනීමට නඩු පවරා තිබීම හාඇතැම් හිමිකරුවන් විදේශ ගත වීම වැනි කරුණු මේ සඳහා හේතු වී තිබුණි. |
| (ආ)කැබලි 4කට කොටස්කර තිබූ සයිමන්ඩේල් වත්ත නැමති ඉඩමේ කැබලි අංක 3 හා අංක 4ට අයත් අක්කර 16 ක් සඳහා 2014 වර්ෂයේදී ලද වන්දිවලට අදාලව 2018 අගෝස්තු 31 දින වන විට ලැබිය යුතු පොළිය වූ රු.මිලියන 5.64ක් අයකර ගෙනනොතිබුණි.එසේම, අක්කර 16 රූඩ් 01 පර්චස් 35කින් සමන්විත කැබලි අංක 01 සහ අංක 02 සඳහා හිමිවිය යුතු රු.මිලියන 2.63ක වන්දි මුදල හා 2018 අගෝස්තු 31 දින වනවිට ලැබිය යුතු රු.මිලියන 6.64 ක පොළී මුදල ද අයකර ගෙන නොතිබුණි. | රජයට පවරාගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | මෙම මුදල ඉදිරි මාස කිහිපයේදී ලැබීමට නියමිතව ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) අක්කර 16 රූඩ් 2 පර්චස් 17 කින් සමන්විත "මත්තේගොඩ කුඹුරු ඉඩම, මොරටුව" නැමති ඉඩමෙන් අක්කර 11 පර්චස් 20.1 ක් කොළඹ දිසා අධිකරණය විසින් මහා භාරකාරවරයාට දුන් අවසරය මත අද ගොවියන්ට විකුණා තිබුණු අතර අක්කර 3 රූඩ් 1 පර්චස් 30 ක් 1999 ජුනි 21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණි. ඒ අනුව තවදුරටත් අක්කර 2 පර්චස් 7ක් මහා භාරකාරවරයා සතුව තිබිය යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බූදලයට අයත් ඉඩම්වල භෞතික හිමිකාරීත්වය මහා භාරකාරවරයා විසින් තහවුරු කර ගත යුතුවීම. | මෙම ඉඩම් හඳුනා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඈ)ඉහත ඉඩමෙන් රජයට පවරාගත් අක්කර 3 රූඩ් 1 පර්චස් 30 ක ඉඩම කැබලි 5කට කොටස් කර තිබූ අතර, 2012 නොවැම්බර් 19 දින රු.885,000 ක වන්දියක් කැබලි අංක 1,2 හා 5 ට හිමිවී තිබුණි.එහෙත් වන්දි මුදලට අමතරව 2018 අගෝස්තු 31 දිනට හිමිවිය යුතු සියයට 7 ක පොළිය වූ රු.841,827 ක මුදල අයකර ගෙන නොතිබුණි. තවද, 2018 අගෝස්තු 31 දින වන විටත් කැබලි අංක 3 සහ 4 සඳහා මහා භාරකාරතැනගේ අයිතිය සනාථ කරගෙන ඊට අදාළ වන්දි මුදල් ලබාගෙන නොතිබුණි. | රජයට පවරා ගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | 3,4 කොටස්වලට අදාල වන්දි මුදල් මේ දක්වා ලැබී නොමැත. වන්දි හා පොළී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ඉ) අක්කර 41 රූඩ් 2 පර්චස් 9ක්වූ "මහරගම කටුවාවල අඹගහපුර" නැමති ඉඩමෙන් අක්කර 1 ක් 2006 දෙසැම්බර් 06 දින රජයට පවරා ගෙන තිබුණු අතර, 2014 ජනවාරි 16 දිනට එම ඉඩමේ තක්සේරු වටිනාකම රු.මිලියන 29ක් විය. වන්දි මුදල් සඳහා හිමිකම් කියන පාර්ශවයන්ගේ විරෝධතා හේතුවෙන් මෙම ඉඩම සම්බන්ධයෙන් නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් වන්දි මුදල් හා පොළී මුදල් ලබා ගැනීමට නොහැකිවී තිබුණි. තවද, මෙම ඉඩමේපර්චස් 31 ක් වූ කොටස | රජයට පවරා ගත් බූදල් ඉඩම් වලට අදාළ වන්දි මුදල් හා පොළී මුදල් බූදලය වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම හා බූදල්කරුගේ අභිප්‍රායන් ඉටුකල යුතු | නඩු කටයුතු අවසන් වූ වහාම අදාළ වන්දි මුදල අයකර ගැනීමට කටයුතු කරන බව |

| | | |
|---|---|---|
| විකුණා එම මුදල් ඩී.එස්.ඩබ්ලිව් සමරකෝන් භාරයට ලබා ගැනීමට 2019 පෙබරවාරි 28 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | වීම. | දන්වා සිටිමි. |
| (ඊ) අක්කර 141 රූඩ් 2 පර්චස් 9.62 කින් සමන්විත "රෙජිඩේල් වත්ත" නැමති ඉඩමෙන් අක්කර 134 රූඩ් 1 පර්චස් 25.92ක් අවස්ථා කිහිපයකදී රජයට පවරාගෙන විකුණා තිබුණි. ඉතිරි බිම් ප්‍රමාණය වන අක්කර 7 රූඩ් 01 පර්චස් 23.70 සම්බන්ධයෙන්ගත්ක්‍රියාමාර්ගපිළි බඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | බූදලයට අයත් ඉඩම්වල භෞතික හිමිකාරීත්වය මහා භාරකාරවරයා විසින් තහවුරු කර ගත යුතු අතර බූදල් කරුගේ අභිප්‍රායන් ඉටු කළ යුතුවීම. | රූඩ්1 පර්චස් 2.62 කඉඩම 2018 අගෝස්තු 10 දිනැති අධිකරණ නියෝගය පරිදි බදු ගිවිසුමක් යටතේ මාසිකව රු.25,000කට බදු දී ඇත. ඉතිරි බිම් කොටස් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. |
| (උ) රෙජිඩේල් වත්ත ඉඩම සඳහා ඉදිරිපත්කළ ගොනු අනුව රජයට පවරාගත් හා විකුණූ අක්කර 56 රූඩ් 2 පර්චස් 22.5 ක කොටස සඳහා රු.මිලියන 3.83 ක් ලැබුණු බව සඳහන් වුවද, එම මුදල් සත්‍ය වශයෙන් ලැබුණු බවට සනාථ කරන තොරතුරු ඉදිරිපත් නොවීය. තවද, අක්කර 1 රූඩ් 2 පර්චස් 18.46 ක් වූ ඉඩම් කොටසක් 2009 ජුනි 02 දින අවසතු කර 2011 මාර්තු 23 දින දෙපාර්තමේන්තුව වෙත නැවත භාර දී මේ වනවිට වර්ෂ 9 ක් ගතවී තිබුණි. එහෙත් එම ඉඩම විකුණා අදාල මුදල් ඩී.එස්.ඩබ්ලිව්. සමරකෝන් බූදලය නමට තැන්පත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | බූදල් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු මහා භාරකාරවරයා විසින් තබා ගත යුතුවීම හා මහා භාරකාරවරයාගේ වගකීම කඩිනමින් ඉටු කර බූදල්කරුගේ අභිප්‍රායන් ඉටු කළ යුතුවීම. | මෙම මුදල් ලැබූ බවට සනාථ කිරීමට අදාළ තොරතුරු දැනට පවතින ගොනු තුළින් සොයා ගැනීමට නොහැකි වී ඇත. අවසතු කර ඇති ඉඩමේ පිඹුර අනුමත වී ඇත්තේ 2017 මාර්තු 29 දිනය. මෙම ප්‍රමාදය නිසා ඉඩම විකිණීමේ කටයුතු ප්‍රමාද වී ඇත. |
| (ඌ) ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් බූදලයට අයත් නිවාස 6ක් 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිම නීති යටතේ වූ1983 මාර්තු 25 දින රජයේ ගැසට් නිවේදනයට අනුව ජාතික නිවාස දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇතත්, එදිනට ගණනය කරන ලද රු.322,438 ක් වූ වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල් ලද බවට | | |

| | | |
|---|---|---|
| ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීය. තවද, බුදල් හිමිකරුගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව පිළියන්දල රෝහලෙහි වාට්ටුවක් ඉදිකිරීමට මහා භාරකාරතැන වෙත පවරා තිබුණු නමුත් එවැනි වාට්ටුවක් ඉදිකළ බවට සාක්ෂි නොවීය. | බුදල් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු මහා භාරකාරවරයා විසින් තබා ගත යුතු අතර බුදල් හිමිකරුගේ අභිමතාර්ථ මහා භාරකාරවරයා ඉටු කළ යුතුවීම. | දැනට පවතින ලිපි ගොනු අනුව වන්දි මුදල් ලැබුණු බවට සනාථ කිරීමට කරුණු සොයා ගැනීමට අපහසු බව දන්වා සිටිමි.සමරකෝන් මැතිඳුගේ මවගේ නමින් නම් කල වාට්ටුවක් ඉදි කිරීම සිදු නොකලද මේ වන විට විශාල ආධාර ප්‍රමාණයක් පිළියන්දල රෝහල වෙත ලබා දී ඇත. රු.මිලියන 1.7 ක් සිංහ සමාජයට ලබා දී ඇති අතර මෙම මුදල් උපයෝගී කර ගනිමින් වෛද්‍ය උපකරණ ඇතුළු බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගෙන ඇති බව එහි නිරීක්ෂණ කටයුතු වලට සහභාගී වූ දෙපාර්තමේන්තු නිළධාරීන්ට දැක ගැනීමට හැකි වී ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| “තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය”ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාළ වන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධනය න්‍යාය පත්‍රයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම දෙපාර්තමේන්තුව වෙනත් දෙපාර්තමේන්තුවකට වඩා සාපේක්ෂව වෙනස් ස්වභාවයක් ගන්නා බැවින් තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා වන ඉලක්ක කරා ලඟාවීමට සෘජුවම හැකියාවක් නොමැත.<br><br>එසේ නමුදු ඉහත දක්වා ඇති පරිදී අන්තිම කැමති පත්‍ර හා භාර ඔප්පුවල අරමුණු |

පිළිබඳව සැලකීමේදී දිළිඳුකම පිටුදැකීම, අධ්‍යාපනය නඟා සිටුවීම, හා සෞඛ්‍ය කටයුතු සඳහා දායක වීම් තුලින් චක්‍රාකාරව තිරසර සංවර්ධන අරමුණු කරා ලඟාවීමට රුකුලක් වී ඇති බව දන්වා සිටිමි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව සියළුම රාජ්‍ය ආයතනවල පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකල යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුව විසින් 2008 වර්ෂයේ දී පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තීන් පිළියෙල කර ඇති අතර මේ වනවිට එය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරනු ලබයි. |